# සමාජ සේවා පුවත්

"Towards a Caring and rights based Society"

පළමුවෙළුම 2011 ඔක්තෝම්බර්




ඔක්තෝම්බර් 01 වන දිනට යෙදෙන ජාතික වැඩිහිටි දින සැමරුම් උළෙල මෙවර බත්තරමුල්ල ජනකලා කේන්ද්‍රයේදි සමාජ සේවා අමාත්‍ය ගරු ෆීලික්ස් පෙරේරා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය සැලසුම් කර ඇත.

## ශ්‍රී ලංකාවේ පවුල් ප්‍රතිපත්තිය.

ශ්‍රී ලංකාවේ ජීවත් වන අවාසි සහගත ජන කොටස් වල අභිවෘද්ධිය සඳහා සමාජ සේවා අමාත්‍යාංශය විසින් සකස් කරන ලද පවුල් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කෙටුම්පත, බත්තරමුල්ලේ පිහිටි වෝටර්ස් එජ් ආයතනයේ දී අගෝස්තු මස 26 වන දින ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් එළි දක්වන ලදි. මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය සකස් කිරීමේදි අදාල අමාත්‍යාංශ වල ලේකම්වරුන්, රාජ්‍ය නොවන සංවිධාන සහ ආධාර ආයතන වල නියෝජිතයින් සහ ප්‍රජාමූල සංවිධාන නියෝජිතවරුන් සමඟ ද සාකච්ඡා පවත්වා ඔවුන්ගේ ද අදහස් ලබාගෙන ඇත. අනතුරුව මෙම කෙටුම්පත ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය. මෙම ප්‍රතිපත්ති මාලාවෙන් කාන්තා මූලික පවුල්, ආබාධිත සහිත තැනැත්තන් සිටින පවුල්, වැඩිහිටි තැනැත්තන් සහ ඔවුන්ගේ පවුල්, විදේශ රැකියා වල නියුක්ත අයගේ පවුල් හා අඩු ආදායම් ලාභී පවුල් පිළිබඳව විශේෂ අවධානය යොමු කර ඇත.



ශ්‍රී ලංකාවේ වෙසෙන වැඩිහිටි තැනැත්තන්, ආබාධිත අය සහ තනිමාපිය පවුල් වල ජනතාව වෙනුවෙන් සමාජ මෙහෙවරක් ඉටු කිරීම උදෙසා විවිධ පියවර රාශියක් දැනටමත් ගෙන ඇත. විශේෂයෙන් ආබාධිත අය සිටින පවුල් වෙත මාසික මූල්‍ය ප්‍රාදානයක් ලබාදෙන අතර ග්‍රාමීය වැඩිහිටි කමිටු පිළිගත් සමිති වශයෙන් ක්‍රියාකිරීමට කටයුතු කර ඇත. සමාජ සේවා අමාත්‍යාංශය යටතේ ලබාදෙන සියලු සේවාවන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා පුවත් හසුනක් එළිදැක්වීම පිළිබඳව මගේ සුභාශිංසන මෙයින් පිරිනමමි.

ගරු ෆීලික්ස් පෙරේරා (පා.ම)
සමාජ සේවා අමාත්‍ය



සමාජ සේවා අමාත්‍යාංශය මගින් විශාල සේවයක් ජනතාවට ඉටු කරනු ලැබුවත්, ඒ පිළිබඳව ජනතාව දැනුවත් වී නොමැති බව විවිධ ප්‍රකාශ වලින් පැහැදිලිවේ. විශේෂයෙන්ම මෙම අමාත්‍යාංශය මගින් දෙනු ලබන විවිධ සේවාවන්, ආධාරක උපකරණ, පිළිබඳව ජනතා දැනුම ප්‍රමාණවත් නොවේ. දිවයිනේ විවිධ ප්‍රදේශවල ජනතා අවශ්‍යතාවයන් ඉටුකිරීම පිණිස ජංගම සේවාවන් පැවැත්වීමටත්, විශේෂයෙන් පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ජලගැල්මෙන් විපතටපත් ජනතාවට අවශ්‍ය සහන සැපයීමටත් මව්සින් කටයුතු කර ඇත. ඒමනිසා සමාජ සේවා අමාත්‍යාංශය මගින් ඉටු කරනු ලබන මහජන සේවාවන් පිළිබඳව ජනතාවට අවබෝධයක් ලබාදීම උදෙසා පුවත් සඟරාවක් පළ කිරීමට ගෙන ඇති පියවර ඉතාමත් කාලෝචිතය.

ගරු චන්ද්‍රසිරි සූරියආරච්චි (පා.ම)
සමාජ සේවා නියෝජ්‍ය අමාත්‍ය

## ජංගම සේවා සහ සුවතාරි සායන

පසුගිය මාස කිහිපය තුලදී දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ජංගම සේවා පැවැත්වීම තුලින් ආබාධිත තැනැත්තන් සඳහා ආධාරක උපකරණ ලබාදීම සහ විශේෂයෙන් වැඩිහිටියන් සඳහා ඇස් කණ්ණාඩි සැපයීම, ගරු අමාත්‍යතුමාගේ හා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. දිස්ත්‍රික් දේශපාලන අධිකාරියේ ඉල්ලීම මත මෙම ජංගම සේවා සංවිධානය කළ අතර අදාල ( 3 වන පිටුවට.....)



පවුල පදනම් කරගත් සංවර්ධනයට මහින්ද චින්තනයෙන් ප්‍රමුඛස්ථානයක් හිමිවී ඇත. සමාජ සේවා අමාත්‍යාංශය සෘජුවම සමාජ සුභ සාධනය සහ සමාජ ආරක්ෂණය සලසන අතර විශේෂයෙන්ම වැඩිහිටි ප්‍රජාවගේ සහ ආබාධ සහිත තැනැත්තන්ගේ මෙන්ම කාන්තා මූලික පවුල් නගා සිටුවීමේ කාර්යයන්හි නිරතව සිටී. සමාජ සේවා අමාත්‍යාංශය මගින් ඉටු කරනු ලබන මෙවැනි සමාජ සත්කාරක සේවා පිළිබඳව පොදු මහජනතාව දැනුවත් කිරීම සඳහා **සමාජ සේවා පුවත්** නමින් මෙම ප්‍රකාශනය එළිදැක්වීමට ලැබීම සම්බන්ධයෙන් සතුටු වෙමි.

ආර්.එම්.එස් රත්නායක
ලේකම්

## ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය.

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යටතේ වැඩිහිටියන් පිළිබඳ ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත. දකුණු ආසියාතික රටවල් අතුරින් ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වන වැඩිහිටියන් සංඛ්‍යාවක් සිටින රටක් ලෙස ශ්‍රී ලංකාව සැලකේ. ඒ අනුව ඉදිරියේදී වැඩිවන වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමත්, සුභසාධන පහසුකම් තව දුරටත් තහවුරු කිරීමත් අරමුණු කොට මෙම ලේකම් කාර්යාලය කටයුතු කරනු ලබයි.

### වැඩිහිටි හැඳුනුම්පත

වයස අවුරුදු 60 ට වැඩි පුද්ගලයින් සඳහා ග්‍රාම නිලධාරී මගින් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයෙන් වැඩිහිටි හැඳුනුම්පත ලබාගත හැකිය. රාජ්‍ය හා පෞද්ගලික අංශවල සියලු කාර්යයන් වලදී ප්‍රමුඛත්වය හිමිවීම, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පතු සඳහා අමතර විශේෂ පොලියක් ලැබීම, රාජ්‍ය ඔසුසල් වලින් ඖෂධ ලබා ගැනීමේදී 5% ක විශේෂ වට්ටමක් ලබාගත හැකිවීම හැඳුනුම්පත් ලාභීන් සඳහා ලැබෙන විශේෂ සේවාවන් වේ.

### ග්‍රාමීය වැඩිහිටි කමිටු



ැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමත් වුන් වෙනුවෙන් සුභසාධන සේවාවන් ක්‍රියාත්මක ිරීම උනන්දු කරවීමත් වැඩිහිටියන්ගේ දායකත්වය ාදේශීය සංවර්ධන කාර්යයන්ට ලබාදීම ඇතුළු ාමීය ප්‍රජාවේ වැඩිහිටි තැනැත්තන්ගේ සමාජීය, ර්ථික, සංස්කෘතික හා අධ්‍යාත්මික සංවර්ධනය දහා මෙම ග්‍රාමීය වැඩිහිටි කමිටු ආරම්භ කර ඇත.

මෙන්ම වෙන්ඩර් පටිපාටියෙන් පරිබාහිරව ම්පාදන කටයුතු සඳහා අනුමත සමිතියක් ලයෙන් සැලකීම සඳහා අමාත්‍ය මණ්ඩල ුමැතිය ග්‍රාමීය වැඩිහිටි කමිටු සඳහා ලැබී ඇත.

### වැඩිහිටි සත්කාරක සේවාව

තම මව්පියන් සඳහා තමා විසින්ම කල නොහැකි මෙහෙය විශ්වාසවන්ත සත්කාරක සේවා සපයන්නෙකු ලවා සිදු කර ගැනීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශය මගින් 2007 වර්ෂයේදී ආරම්භ කරන ලද විධිමත් වැඩපිළිවෙල වැඩිහිටි සත්කාරක සේවාවයි'. මෙහි නව අදියර වශයෙන් 2011.08.22 සිට 2011.09.09 දක්වා සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශ ශාලාවේදී පුහුණු ලාභීන් 30 දෙනෙකු පමණ පුහුණු කරවන ලදි.

### සමාජ වැඩකරුවන් බිහි කිරීම.



ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධන හා සමාජ සුභසාධන කාර්යයේ අවශ්‍යතාවයක් වන වෘත්තිය සමාජ වැඩකරුවන් බිහිකිරීමට අවශ්‍ය සමාජ වැඩ අධ්‍යාපනය ලබාදීමට පුරෝගාමී වන්නේ ජාතික සමාජ සංවර්ධන ආයතනයයි. 1992 අංක 41 දරණ ආයතනික පනතින් මෙම ආයතනය ස්ථාපිත කරන ලද අතර සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (BSW) හා සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MSW) මෙම ආයතනය මගින් පිරිනමයි. එමෙන්ම සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, මනෝ විද්‍යා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, ළමා රක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සහ වෙනත් කාලීන පාඨමාලා මෙම ආයතනය යටතේ හැදෑරීමට අවස්ථාව උදාකර ගත හැකිය. වැඩිදුර තොරතුර සඳහා අධ්‍යක්ෂ ජනරාල් - 011 2882501 අමතන්න.

### ආබාධ සහිත තැනැත්තන් සඳහා සහන රුසක්

ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය මගින් ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම, වැඩි දියුණු කිරීම හා සුරක්ෂිතභාවය ඇති කිරීම උදෙසා ඔවුන් වෙනුවෙන් සහන රැසක් දියත් කරනු ලබයි.

### ආබාධ සහිත පුද්ගලයින් සඳහා ආධාරක උපකරණ ලබා දීම.



දිවයින පුරා පවත්වනු ලබන ජංගම සේවා මගින් රෝද පුටු, අත්වාරු, කිහිලිකරු, ඇස් කණ්ණාඩි යනාදිය ලබා දේ.

### මහින්ද චින්තන වැඩසටහන යටතේ ආබාධ සහිත තැනැත්තන් සඳහා මාසිකව ලබාදෙන රු:3000/- දීමනාව



සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින්ම ආබාධිත පවුල් 34 ක් බැගින් පවුල් 11,216 ක් සඳහා මෙම දීමනාව ලබාදේ.

### මැතිවරණ විශේෂ විධි විධාන පනත

ආබාධ සහිත තැනැත්තෙකුට මැතිවරණයකදී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා තමන් කැමති තැනැත්තෙකු කැටුව යාමට අවසර ලබා දෙන මැතිවරණ විශේෂ විධි විධාන පනත 2011.04.05 දින පාර්ලිමේන්තුවේදී සම්මත විය.

### ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩසටහන (සී.බී.ආර්)

ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීමත්, රැකදීමත් තුළින් ඔවුන් බලගැන්වීමටත්, ඒ තුළින් ඔවුන් සමාජ සංවර්ධනයේ කොටස්කරුවන් බවට පත්කරලීමට කටයුතු කිරීම මෙමගින් සිදු කරයි. ආබාධිත බව පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ මෙවලම සී. බී. ආර් වැඩසටහනයි.

1994 සිට ජාතික වැඩසටහනක් ලෙසට ක්‍රියාත්මක වන මෙය දිස්ත්‍රික්ක 25 තුළම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 273 ක ක්‍රියාත්මක වේ. 2012 වසර තුළ ශ්‍රී ලංකාවේ සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ සියලු ග්‍රාම නිලධාරී වසම් තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

ආබාධ සහිත පුද්ගලයින් හඳුනාගැනීම, තක්සේරු කිරීම, අවශ්‍යතා සොයාබැලීම, යොමු කිරීම සහ නිවසේ පුහුණුව ද මෙහි අන්තර්ගතය. ඒ මගින් ඔවුන් සමාජයට අවතීර්ණ කිරීම සිදු කරයි. සී. බී. ආර්. යනු ආබාධ සහිත පුද්ගලයින් සාමාන්‍ය ප්‍රවාහයට අන්තර්කරණය කිරීම හා සංවර්ධනයයි.

## 24 පැයේ ජංගම දුරකථන උපදේශන සේවාව.

මනෝ විද්‍යාත්මක ක්‍රමවේද මගින් පුද්ගල පෞරුෂ සංවර්ධනය, අසමතුලිත මානසික තත්වයන් වැලැක්වීම ආයතනික සම්බන්ධීකරණය, නායකත්වය දීම, දැනුවත් කිරීම සහ උපදේශන අවශ්‍යතා සැපයීම මගින් මානසික සෞඛ්‍ය ඉහළ නංවා සෑම පුරවැසියෙකුම ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනයට දායක කරවීමේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම උදෙසා 2001 වර්ෂයේ සමාජ සේවා අමාත්‍යාංශය තුළ උපදේශන අංශය ආරම්භ කරනු ලැබිණි. මෙම සේවාව දිවයින පුරා ලබා දීම සඳහා උපදේශන සහකාර නිලධාරීන් 97 දෙනෙකු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර ඇත. මෙයට අමතරව උතුරු නැගෙනහිර පළාත් වල යුද්ධයෙන් අවතැන් වූ ජනතාවට උපදේශන සේවා සැපයීම සඳහා යුනිසෙෆ් ආධාර යටතේ උපදේශන නිලධාරීන් හා මනෝ සමාජීය වැඩකරුවන් 20 දෙනෙකු යොදවා ඇත. එමෙන්ම 24 පැයේ ජංගම දුරකථන උපදේශන සේවාව මගින්, දිවයින් පුරා සිටින උපදේශන නිලධාරීන් ප්‍රජාව හා සම්බන්ධ කිරීම සිදු කෙරේ.

පහත දැක්වෙන දුරකථන අංක මගින් උපදේශන සේවාවන් 24 පැයේම ලබාගත හැක.

අධ්‍යක්ෂ (උපදේශන අංශය) - 071538001
උපදේශන නිලධාරීන් - ප්‍රධාන කාර්යාලය 0715380003, 0715380045 එමෙන්ම 0715380 හා ටෙලිකොම් දිස්ත්‍රික් අංකය ඇතුලත් කර දිස්ත්‍රික් උපදේශන සේවාවන් ලබාගත හැකිය.

උදාහරණයක් ලෙස

කුරුණෑගල - 0715380037,

ගම්පහ - 0715380033

### සිසුනැණ පුබුදුව

වර්තමාන පරපුරේ දරුවන් පුරුද්දක් ලෙස කියවීමට හුරුකරවන වැඩසටහනක් ලෙස මෙය ක්‍රියාත්මක කෙරේ. මෙම වැඩසටහන කියවීමේ පහසුකම් අඩු ඉතා දුෂ්කර ප්‍රදේශවල ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත. ඒ අනුව දැනට 2011 වසරේ නාවලපිටිය, ගම්පොල, හඟුරන්කෙත, නවගත්තේගම, රඹුක්කන, රුවන්වැල්ල හා දෙහිඕවිට යන ප්‍රදේශ වල මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කෙරේ.

## සමාජ සත්කාරක මධ්‍යස්ථාන ව්‍යාපෘතිය

මෙය සුනාමි ව්‍යසනයට ගොදුරු වූවන්ගේ ජීවන තත්වය නගා සිටුවීම උදෙසා ගනු ලැබූ පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපන කටයුතු වලට අත්වැලක් වශයෙන් ආරම්භ විය. ව්‍යාපෘතියේ අපේක්ෂාව වූයේ සේවා ලබන්නන්ට හිතකර පරිසරයක් තුළ ඒකාබද්ධ පූර්ණ සුභසාධන සේවාවක් ලබාදීමයි. සමාජ සේවා අමාත්‍යාංශය, ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය හා පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවට අයත් ක්ෂේත්‍ර නිලධාරීන් මෙම සේවා සැපයුම සඳහා දායකත්වය ලබාදේ.

UNICEF ආයතනය හා Save the Children in Sri Lanka යන ආයතන වල අනුග්‍රහය අනුව මෙම මධ්‍යස්ථාන පිහිටුවනු ලැබිය.

### වැඩිහිටියන්ට ගෞරවනීයව සලකමු.

ශ්‍රී ලංකාවේ වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ වර්ෂ 2000 අංක 9 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පාර්ලිමේන්තු පනත ඇති කිරීම වැඩිහිටියන්ගේ සුභ සාධනය පිළිබඳ නීතිමය විධිවිධාන වල ඉදිරි පිම්මකි. මෙම පනත අනුව වයස්ගත වීම සම්බන්ධයෙන් ජාතික සභාවක් පිහිටුවා එමගින් වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් හා සුභසාධනය ඇති කිරීම පිළිබඳ රජයට උපදෙස් දීමේ බලය පවරා ඇත. එම පනතේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකාවේ පාරම්පරික සාරධර්ම මත පදනම්ව පවුල් ඒකකය ශක්තිමත් කිරීම සඳහා රජයට හා අනෙකුත් සුදුසු ආයතන වලට වැඩසටහන් නිර්දේශ කිරීමේ බලය පවරා ඇත. එසේම වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පනත මගින් විධි විධාන රැසක් යොදනු ඇත.

මාගේ අත්දැකීමෙන් පැහැදිලි කල හැක්කේ ශ්‍රී ලංකාවේ සමහර ප්‍රදේශවල අපේ වැඩිහිටි කමිටු විසින් කර ඇති සේවාව අප්‍රමාණය බවයි. වයස්ගත වැඩිහිටියාගේ සියලුම කටයුතු ඔවුන්ගේ ඕනෑ එපාකම් සොයා බලන්නේ එම කමිටු වලින් බව පෙන්වා දිය හැකිය.අවාසනාව නම් මේවා අගය කිරීමකට ලක් නොවීමයි.

කේ.ජ් . ගුණදාස පෙරේරා
ජාතික වැඩිහිටි සභාවේ සාමාජික

> තම ජීවිතය දරුවන් වෙනුවෙන්, රට දැය වෙනුවෙන් කැපකල ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට තනි වීමට මම ඉඩ නොතබමි.
> (මහින්ද චින්තන - 2010, පිටුව 15)

### ජංගම සේවා ........

ප්‍රාදේශීය ලේකම්වරුන් අවශ්‍ය අනෙකුත් පහසුකම් සපයන ලදී. මෙම වසර තුළදී දැනට ජංගම සේවා 67 කට අධික ප්‍රමාණයක් පවත්වා ඇත. එමගින් ප්‍රතිලාභීන් 24774කට සහන සැලසිනි.
ජා ඇල ප්‍රාදේශීය සභාව හා ඒකාබද්ධව කාන්තාවන් සඳහා සුවනාරි සායන පැවැත්වීම අඛණ්ඩව සිදුකෙරේ. මෙහිදී කිසිදු ගෙවීමකින් තොරව අවශ්‍ය සියලුම රසායනාගාර පරීක්ෂණ සිදුකරන අතර ප්‍රතිලාභීන්ට පිළිකාව, දියවැඩියාව සහ රුධිර රෝග පිළිබඳ අවධානම් තත්වයන් අවබෝධ කරදෙනු ඇත.

### ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානය - නාවින්න මහරගම

ළමයෙකුගේ වර්ධනයේ කිසියම් ප්‍රමාදයක් ඇති බව හඳුනාගත් විට හෝ එවැනි ප්‍රමාදයක් ඇති බවට සැක සහිත හෝ ආබාධයක් ඇති බවට හඳුනාගත් විට ප්‍රථමයෙන් යොමු කල හැකි රාජ්‍ය අංශයේ ඇති එකම ආයතනය සමාජ සේවා දෙපාර්තමේන්තුවට අයත් ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථානයයි. විශේෂ අවශ්‍යතා ඇති ළමුන්ට වඩා ඵලදායී හා කාර්යක්ෂම සේවාවන් ලබා දීමටත් ප්‍රාදේශීය මට්ටමින් ඇති එවැනි සේවා සපයන අධ්‍යාපන සුභ සාධන හා සෞඛ්‍ය යන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල සේවාවන් සම්බන්ධීකරණය කිරීමත් මෙම ආයතනය මගින් ඉටු කරන සේවාවන් වේ.

දරුවකු ආබාධ ඇති බවට හඳුනාගැනීමෙන් පසු ප්‍රථමයෙන් මෙම ආයතනයට යොමු කිරීමටත්, ඉන් අනතුරුව දෙමාපියන්ගෙන් තොරතුරු ලබා ගෙන වර්ධන මට්ටම තක්සේරු කිරීමෙන් අනතුරුව වෘත්තිකයන් විසින් දරුවා පරීක්ෂා කිරීමෙන් පසුව සුදුසු සැලසුම් සැකසීමත්, අවශ්‍ය යොමු කිරීම් හා පසුහාර කටයුතු සිදු කිරීමත් මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයන් වේ.

මග පෙන්වීම
ආර්.එම්.එස් රත්නායක - ලේකම්
ලාල් රත්නවීර - අධ්‍යක්ෂ (සැලසුම්)

සමාජ සේවා අමාත්‍යාංශය,
5 වන මහල, සෙත්සිරිපාය,බත්තරමුල්ල.
දු.ක : 0112887349 - 51
ඊමේල් : msssec@sltnet.lk

**வட மாகாணத்தில் உள்ளூரில் இடம்பெயர்ந்தவர்களுக்கான விஷேட உளவளத்துணை நிகழ்ச்சி.**

2009 ஆம் ஆண்டிலிருந்து சமூக சேவைகள் அமைச்சின் உளவளத்துணை நிலையம் வட மாகாணத்தில் உள்ளக ரீதியில் இடம்பெயர்ந்தவர்களுக்கான விஷேட உளவளத்துணை நிகழ்ச்சியினை நடாத்தியுள்ளது. தற்போது 20 உளவளத்துணையாளர்களும் மற்றும் உளசமூகப் பணியாளர்களும் யுனிசெவ் செயற்திட்டத்தின் கீழ் பணியாற்றிக் கொண்டிருக்கின்றனர். இந்நிகழ்ச்சித் திட்டத்தின் கீழ் புனர்வாழ்வு மற்றும் சமுதாய நீரோட்டத்தில் மீள இணைத்தல் செயற்பாடுகள், புனர்வாழ்வு மற்றும் சிறைச்சாலை மேம்பாட்டு அமைச்சின் உதவியுடன் மேற்கொள்ளப்பட்டுள்ளன.

புனர்வாழ்வுக்கான ஆணையாளர் நாயகப் பணியகம், ஆரம்ப நிகழ்ச்சித்திட்டத்திற்காக 2010 ஆகஸ்டு மாதத்தில் ஐக்கிய அமெரிக்காவின் வான்படையின் வள நபர்கள் மற்றும் உளவளத்துணையாளர்களின் உதவியினைப் பெற்றுக்கொண்டது. மேலும் அவற்றினைத் தொடர்ந்து இலங்கையின் வட மாகாணத்திலுள்ள புனர்வாழ்வு நிலையங்களிலுள்ள முன்னைய நாள் தமிழ் ஈழ விடுதலைப் புலிகளுக்கான புனர்வாழ்வு, மீள இணைத்தல் நல்லிணக்க நிகழ்ச்சிகளின் தொடர்கள் நடாத்தப்பட்டுள்ளன. இந்நிகழ்ச்சியின் ஒரு பகுதி புனர்வாழ்வுக்கான ஆணையாளர் நாயகப் பணியகம் எதிர்காலத்தில் சமுதாய நீரோட்டத்தில் பயனாளிகளினை மீள இணைப்பதற்கு மீள் இணைக்கும் பயிற்சி நிகழ்ச்சிகளின் தொடரினை நடாத்துவதற்கு திட்டமிட்டுள்ளது.

இந்நிகழ்ச்சித் திட்டத்தினை பலப்படுத்துவதற்கு யுனிசெவ் செயற்திட்டத்தின் கீழ் தொண்டாற்றுகின்ற உளவளத்துணையாளர்கள் மற்றும் உளசமூகப் பணியாளர்கள் தங்களின் உதவியினை வழங்கியுள்ளனர். மேலும் அவர்கள் புனர்வாழ்வுக்கான ஆணையாளர் நாயகப் பணியகத்தினால் நடாத்தப்பட்ட அனைத்து வேலையரங்குகளிலும் விருப்புடன் பங்குபற்றியுள்ளனர்.

## යුනෙස්කෝ සමුළුව




2011 පෙබරවාරි 20 - 22 දක්වා කොළඹ දී, සාර්ක් රටවල සමාජ සේවා විෂය භාර අමාත්‍යවරුන්ගේ තුන්වන යුනෙස්කෝ සමුළුව පවත්වන ලදි. මෙම සමුළුවේ සභාපති ධුරයට ගරු ෆීලික්ස් පෙරේරා, ශ්‍රී ලංකාවේ සමාජ සේවා අමාත්‍යවරයා නිතරගයෙන් පත්වන ලදි. මෙම සමුළුව සඳහා සාර්ක් රටවල් 8 හි සමාජ සේවා විෂය භාර අමාත්‍යවරුන් සහභාගි වූ අතර එම රටවල රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් ද සහභාගි විය. සමුළුව අවසානයේදී කොළඹ ප්‍රකාශනය' නමින් සියලුම ගරු අමාත්‍යවරුන්ගේ අත්සනින් යුත් ප්‍රතිපත්ති මාලාවක් එළි දක්වන ලදි.

එමගින් ප්‍රධාන වශයෙන් අපේක්ෂා කරන ලද්දේ මෙම රටවල් 8 හි සමාජ ආරක්ෂණය සඳහා කලාපීය සහයෝගිතාවය වර්ධනය කිරීම, දැනට ක්‍රියාත්මක සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති සහ වැඩසටහන් වල අඩුපාඩු පරීක්ෂා කර බලා ඒවා තවදුරටත් ශක්තිමත් කිරීම සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දෙන ලද සමාජ ආරක්ෂණ වැඩසටහන් දියත් කිරීම නම් වූ විශේෂ වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක කිරීමය.

**சமூக சேவைகள் அமைச்சின் அங்கவீனமுற்றோருக்கான தேசிய செயலகமானது அங்கவீனமுற்றோருக்காக விசேட செயற்திட்டங்களை மேற்கொண்டு வருகின்றது.**

"மஹிந்த சிந்தனைக் கொள்கைப் பிரகடனத்தின்" கீழ் அங்கவீனமுற்ற நபர்களினைக் கொண்டுள்ள குடும்பங்களுக்கு ரூபா. 3000/- கொடுப்பனவினைப் பெற்றுக்கொடுத்தல்.

அங்கவீனமுற்ற நபர்கள் சுயதொழிலினை மேற்கொள்வதற்கு ரூபா. 10,000/- வழங்குதல்.

அங்கவீனமுற்ற நபர்களின் குடும்பங்களுக்காக வீடமைப்பு உதவி - ரூபா. 150,000/-

அங்கவீனமுற்ற நபர்களுக்கு உதவி உபகரணங்களை வழங்குதல்.

அங்கவீனமுற்ற நபர்களுக்கு உட்பிரவேசிப்பு வழங்குதல்

ආබාධ සහිත පුද්ගලයින් සමාජයේ අභිමානවත් පිරිසක් ලෙස ජීවත් වීමට අවශ්‍ය සමාජ, ආර්ථික, මානසික පරිසරයක් නිර්මාණය කිරීම ප්‍රමුඛ කාර්යයකි. (මහින්ද චින්තන - 2010 පිටුව 24)